# "ගොවියෙකුගෙන්"

කල්යල් නොතකා දැතේ සවියෙන් ජාතිය නංවන ලොකු පොඩ්ඩි
ගොවි හදවත් වල ලේ ධාබිඳුවී පිරුණා වැව් ගං දිය කඩ්ඩි
යල මහ පීදෙන වෙල්එලියේදී දුප්පත්කම පිළිලය මඩ්ඩි
රන් අස්වනු පුරවාගෙන ගෙපැලට සිරිකත සහ පිරිවර වඩ්ඩි

වයිරා, හඳයා, අඩහැර තාලෙට මත්වී හීයට පණ පොවනා
මැණිකෙගෙ දැතින් සැකසුන තීයල ඇඹුලෙන් තොලකට රස මැවුනා
ඕංචිලිවාරම්, පැල්කවි මුසුවී මඳ සුලඟින් සරතැස නිවනා
සුන්දර කාලය ළඟලඟ එනවා ගොවියකු හට අමතක නොවනා

වියගහ, හීලණු, අම්බරු, එක්වී නගුලෙනි හීයක් හෑ වෙන්නේ
දෑකැති, මානකු කමතට රැස්වී උකුණෙන් පිදුරුය බේ රෙන්නේ
කොලයා, මැදයා, කලාතයාගෙනි, ගොයමේ කොලගෙඩි පෑ ගෙන්නේ
බැත ගොඩවන විට ඉපිලෙන සතුටින් රෑ එළිවෙනවා නෑ දන්නේ

මඩසෝදා ගෙන රජකම හොබවන අයිතිය උරුමෙන් ලබා ඇතී
අගහිග කම් නැති රටටම බත දෙන 'ගොවියා' සමවන කෙනෙකු නැතී
අම්මේ, අප්පේ, සොයුරණි, එක්වනු ඇරයුම දෙමි මා හදිනි බැතී
නිදිගැට දුරලා පෙරමුන අරගමු ගොවි සටනට එකමුතුව නිතී

නිවහල් දැයකට නිගා නොදෙනු මැන පිටරට හාලට අත පාලා
ලොවම උතුම් හෙළබීම සිංහලකම පෙන්වා කාටත් හඩ ගාලා
යුතුකම උරුමය රැකගැනුමකි මෙය ගොවියෙකු වීමෙන් ඉපි දීලා
මැරුනත් සැපතකි ඔබ ඉපයූ එක බත් වේලක් කෙනෙකුට දීලා

මො/වැංවත්ත කනිටු විදුහලේ
ආචාර්ය සෝමපාල විදුරුපොල